# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - සිව්වන වසර - 2016/ 2017

## පරිසර නීතිය

**පැ තුනයි (03)**

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07**

ඕනෑම ප්‍රශ්න <u>හතරකට</u> (04) පමණක් පිළිතුරු සපයන්න.
**(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)**

---

01. පිරිසිදු වාතය, පිරිසිදු ජලය සහ ස්වභාව ධර්මයේ අනෙකුත් සාධක මූලික මිනිස් අයිතිවාසිකම් සහ මානව ගරුත්වය රැක ගැනීමෙහිලා ඉමහත් ලෙස දායක වේ.

    ස්වභාව ධර්මය සහ මානව හිමිකම් අතර පවතින සම්බන්ධතාවය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පදනම් කරගනිමින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

02. මීතොටපෝරේ යනු ඉන්දියන් නගරයේ පිහිටි දිවයිනකි. එහි අග නගරයේ තිබූ විශාල කුණු කන්දක් කඩා වැටීමෙන් පසුව එහි රජය විසින් නගරයට යාබදව පිහිටි තෙත් භූමියකට කුණු කසල බැහැර කරයි. එම තෙත් භූමියෙහි වසර 2000 ක් ගණනකටත් වඩා කාලයක් ආදිවාසී ජනතාවක් ජීවත් වේ. එම ජන කොට්ඨාශයට අනුව තෙත් භූමියෙහි ජලය දිව්‍යමය බලයකින් යුක්ත වන අතර, එහි ජීවත් වන වැන්දඹුවන් සෑම පුරපෝය දිනකම තෙත් බිමෙහි වෙනත් ප්‍රදේශයක දිය කැපීමේ චාරිත්‍රයක නිරත වේ. පුරපෝය දිනවලදී මෙම ජනතාව විසින් තෙත් බිමෙහි ජීවත් වන කුරුල්ලන්ට කෑම සපයන අතර, මෙම ක්‍රියාවට අසල්වැසි රටවල්වලින් පැමිණි වඳවීමේ තර්ජනයට ලක් වූ සංචාරක පක්ෂීන් පවා ආකර්ශනය වේ. රජය විසින් තෙත් බිම් කලාපය තුළ විශාල පරිමාණයක් ඩයිනමයිට් යොදා ගනු ලබන ගල් කැඩීමේ ව්‍යාපාරයෙන් ආරම්භ කර ඇත. මීතොටපෝරේ රජය රටේ පවතින කිසිදු ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයකට එකඟව කටයුතු කර නැත. අ.පි.බ.

පරිසරය ආරක්ෂා කිරීමට අදාළවන වැදගත් අන්තර්ජාතික සම්මුතීන් සියල්ලටම මීතොටපෝරේ සාමාජික රාජ්‍යයක් වන අතර එහි නීති ක්‍රමය ශ්‍රී ලංකාවේ නීති ක්‍රමයට සමාන බව උපකල්පනය කරන්න.

ඉහත සිදුවීමෙහි දී අන්තර්ජාතික සම්මුතීන්හි සහ දේශීය ව්‍යවස්ථාවන්හි කුමන ප්‍රතිපාදන කවර ප්‍රමාණයකට උල්ලංඝනය වන්නේ ද යන්න සාකච්ඡා කරන්න.

03. අපරාධ නීතියෙහි හරයාත්මක සහ කාර්ය පටිපාටික දෘෂ්ටි කෝණයන් යනු පරිසර නීතියේ වර්ධනයට හේතු කාරක වූ ක්ෂේත්‍රයන් අතුරෙන් එකකි.

පරිසරය ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීමෙහි ලා අපරාධ නීතිය යෙදවීමෙහි කාර්යක්ෂමතාව උදාහරණ සහිතව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

04. (අ) සාගර දූෂණය වැළැක්වීම පිණිස නැව් හිමිකරුවෙකුව වගකීමට බැඳවීමේ නීති ප්‍රතිපාදන සාගර දූෂණය වැළැක්වීමේ පනත තුළ ප්‍රමාණාත්මකව පවතීද යන්න සාකච්ඡා කරන්න.

(ආ) පෝට්සිටිපෝරේ ඉන්දියන් සාගරයේ දිවයිනකි. පෝට්සිටිපොරේ හි අගනුවර විරාය අසළ වෙරළ කලාපය තුළ සුඛෝපභෝගී කාමර 750 කින් යුතු ඕෂන් පෝට් මහල් නමින් නිවාස සංකීර්ණයක් ඉදිකිරීම පිණිස පෝට්සිටිපොරේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විදේශීය සමාගමක් වන ෂැංග්හයි ඕෂන් බිල්ඩර්ස් සංඝා ගිවිසුමකට එළඹ ඇත. ලැබී ඇති තොරතුරුවලට අනුව හඳුනාගත් ප්‍රදේශයකින් කොරල් සහ පැලැටි ඉවත් කරගෙන ඇති අතර දැනටමත් භූමිය ගොඩ කිරීම ආරම්භ කර ඇත. නිලධාරීන් ප්‍රකාශ කරන්නේ අදාළ අධිකාරීන්ට මේ පිළිබඳව දැනුමක් නොමැති බවයි.

පෝට්සිටිපෝරේහි නීති ක්‍රමය ශ්‍රී ලංකාවේ නීතිය නීති ක්‍රමයට සමාන වන බවට උපකල්පනය කරන්න.

ඉහත අවස්ථාවේදී කුමන නීති ප්‍රතිපාදන උල්ලංඝනය වන්නේදැයි හේතු දක්වමින් සාකච්ඡා කරන්න.

අ.පි.බ.

05. අන්තර්ජාතික පාරිසරික නීති පර්ෂදය ඇසුරෙන් ශ්‍රී ලංකාවේ නීති පර්ෂදය විසින් කෙතරම් දුරට චිරස්ථායි සංවර්ධනය ප්‍රවර්ධනය කර තිබේද යන්න විවේචනාත්මකව විමර්ශනය කරන්න.

06. ශාක සහ සත්වයින් ආරක්ෂා කිරිමේ ආඥා පනතේ දීර්ඝ නාමය දක්වන්නේ:

"ශාක සහ සත්වයින් ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා වන ශාක සහ සත්වයින් සහ ඔවුන්ගේ වාසස්ථාන අවභාවිතය සහ වෙළඳාමේ නිරතවීම වැළැක්වීම ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා වන ආඥා පනත (අවධාරණය වන පරිදි)

ශාක හා සත්වයින් ආරක්ෂා කරන ආඥාපනත පදනම් කරගනිමින් ලංකාවේ ශාක හා සත්වයින් මෙන්ම ඔවුන්ගේ වාසස්ථාන ආරක්ෂා කිරිමට සහ සංරක්ෂණයට ප්‍රමාණවත් ප්‍රතිපාදන ආඥාපනත තුළ අන්තර්ගත වේද යන්න සාකච්ඡා කරන්න.

07. හෙන්රි, නම් සුප්‍රසිද්ධ කෝටිපති ව්‍යාපාරිකයා ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග සම්බන්ධයෙන් මහා පරිමාණ ආයෝජනයක් කිරීමට තීරණය කරයි.

අදාළ නඩු තීන්දු ආශ්‍රයෙන් මෙම ව්‍යාපෘතියේ අනුමැතියට අවශ්‍ය කාර්යපටිපාටියට අදාළ වන ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන් සාකච්ඡා කරන්න.

හෙන්රිට උපදෙස් දෙන්න.

○o○o○o○o○o○o○o